



# නාට්‍ය, වේදිකාව, රංගය සහ මෙල්බර්න් ප්‍රජාව - 2

ආචාර්ය තරංග දන්දෙනිය

ඕනෑම ඉතිහාසයක් සැලකීමේදී එම ඉතිහාසයේ ජීවත් වීම මෙන්ම එම ඉතිහාසය වාර්ථා කිරීමද සංකීර්ණය. තමා ජීවත් වූ කාලයේ ඉතිහාසය වාර්ථා කරන්නා හට පවතින සමාජධාරාවේ ආකල්ප සහ පෞද්ගලික ආකල්පවලින් මිදීමට අපහසුය. ඇතැම්විට එය බලවන්තයා සහ අනුවර්ථකයා පිළිබඳ සටහනකි. තමන්ට පෙර කාලයක දේ සටහන් කරන්නා හට සිදුවන්නේ අනුන්ගේ මතකය ඔස්සේ යෑමට හෝ ඉතුරු වී ගිය සටහන් මගින් කල්පිතයක් ගොඩ නැංවීමටය. එමෙන්ම, වාර්ථා කරන්නා හට යම් සිදුවීම් සමුදායක් තෝරාගන්නටද සිදුවෙයි.

යම් සංසිද්ධියක් යනු එයට සහභාගි වූ සහ ප්‍රතික්‍රියා දැක්වූ බොහෝමයක එකතුවෙන් හටගන්නක් වුවද සටහන් වන්නේ අතලොස- 'සක් ගැන පමණක්ය. එබැවින් බොහෝ ඉතිහාස පොත්වල ඇත්තේ රජුන් සහ සෙනෙවියන්ගේ නම් පමණක්ය. (ඔවුන්ගේ බිසෝවරුන්ගේ බලපෑම් බොහෝ වුවද ඒවාද නොසලකා තිබේ.)

කලා කටයුතු පිළිබඳ ඉතිහාසය ලිවීමේදී ද මේ ධර්මතාවය අඩුවැඩි වශයෙන් බලපවත්වනු ලැබේ. සාමුහික ක්‍රියාවක් වන කලා ක්‍රියාකාරකම් සටහන් කිරීමේදී ඇතැම්විට පුද්ගල නාම ගිලිහී යා හැක. එහෙත් සිදුවීම් ලිවීම ප්‍රයෝජනවත්ය. මෙල්බර්න්හි රංග කලාවේ ප්‍රවනතා පිළිබඳ ලියනා මේ ලිපියෙහි ඇති කරුණු වෙනත් අයුරකින් ඉදිරිපත් කිරීමට සහ අඩුතැන් පිරවීමට විවෘතය. එය කුමන මාධ්‍යකින් හෝ සිදුකළ හැකිය.

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකීය රංගයක් ඉදිරිපත් වී නම් එය මෙරට ට සංක්‍රමණය වූවන් ගේ මුල් ඉතිහාසය තෙක් දිවෙන බව පැහැදිලිය. එම රංගය, ඒ සංක්‍රමණිකයෝ තම මතකය ඔස්සේ කී කවියක් හෝ පදමට රත්වී- මෙන් පසුව කෙරෙනා විලම්භිත නැටුමක් විය හැකිය. 1871 ජන සංඝණනයට අනුව 58 දෙනෙක් වූ ශ්‍රී ලාංකිකයෝ ද, එයටත් බොහෝ පෙරාතුව, ඕස්ට්‍රේලියාවේ (වික්ටෝරියා ප්‍රාන්තයේ) සිතියමට 'බඩගිනි' (Baddaginnie) නමින් ගමක් නම් කළ ශ්‍රී ලංකාවට සබඳකම් කියූ මිනින්දෝරුවෝ ද මෙලෙස ප්‍රසාංගික අංග තම සංතෘෂ්ටිය උදෙසා හෝ මිතුරු සමාගම් හිදී සිදුකළ බව අනුමාන කළ හැක්කේ රසඥතාව හෝ කලා ප්‍රකාශනාත්මක හැකියාව මිනිසා ලඟ ඇති බැවින්ය.

20 වැනි ශතවර්ෂයේ මුල් භාගයේදී ඕස්ට්‍රේලියාව යනු ශ්‍රී ලාංකීය සංක්‍රමණිකයන්ගේ ජනප්‍රිය නවාතැන් පොළක් නොවන්නේ අනෙක් බටහිර රටවලට සාපේක්ෂව මෙරට තිබූ අඩු පහසුකම් නිසා පමණක් නොව 1901 දෙසැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවෙන් සම්මත කරගත් 'සුද්දන්ට පමණක්' වූ White Australia Policy පනත මගින් සිදුකළ. හම සුදු නොවන්නා වූ (බ්‍රිතාන්‍ය වැනි ඉංග්‍රීසි මාතෘ භාෂක) සංක්‍රමනිකයන් හට ඉදිකළ වැට නිසාය. මෙම නීතියේ ප්‍රතිඵල ලෙස සංක්‍රමිණකයන් නැවැත්වීමට හැකි වුනේ ඒ සඳහා වූ කියවන විට ලිවීමේ විභාගය නිසාය. බ්‍රිතාන්‍ය ජාතිකයන් නොවන්නන් හට එසේ දුන් වචන 50ක ඡේදයක් අති නිවැරදිතාවකින් ලිවීමට වූ අතර 1909 වසර වන විට 1359 වතාවක් පැවැත්වූ විභාගවලින් සමත්ව තිබී ඇත්තේ 53 දෙනෙක් පමණක්ය. අසමත් වූවෝ නැවත හරවා යවන ලදී. 1909 වසරේ සිට මේ පරීක්ෂණය තවත් අසීරු කළ නිසා, දශක ගණනාවකට පසු ඒ නීති ලිහිල් කරන තෙක්, කිසිවෙකුද මේ කියවන විට ලිවීමේ විභාගය සමත්ව නොතිබිණි. සංක්‍රමණිකයන් ගැන වූ ජන සංඝණන සටහන් අනුව 1933 දී පවා වික්ටෝරියාවේ සිටියේ 'බර්ගර්' ජන කොට්ඨාශයේ පුද්ගලයෝ 130 දෙනෙක් පමණක්ය.

දෙවන ලෝක යුද්ධයට සමගාමීව යුරෝපියානු සරණාගතයන් හට ඉඩ සැලසුනාක් මෙන්ම 1948 දී ශ්‍රී ලංකාවට හිමි වූ 'ඩොමිනියන් නිදහස' හේතුකරගෙන රටින් පිටව ආ 'බර්ගර් ජන' කණ්ඩායම් හට ද ස්වල්ප කාලයකට පසු පොදු ශ්‍රී ලාංකිකයන් අතලොස්සකට ද තාවකාලිකව ඕස්ට්‍රේලියාවට ඒමට ඉඩ සැලසුනි. අපට මූලිකව හමුවන රංගකලා ක්‍රියා කාරකම් ඔවුන්ගේ දායකත්වයෙන් සිදු වූ ඒවාය.


THE DINAMINA
ඉතාම විශාල ලෙස පැතිරෙන දිනපතා පත්‍රය
වර්ෂ 1968 ක්වූ මාර්තු මස 3 වැනි ඉරිදා

1950 දී කොළඹදී පැවැත් වූ කොමන්වෙල්ත් රටවල විදේශ ඇමතිවරුන් සම්මන්ත්‍රණයේදී යම් යම් ක්ෂේත්‍රයන් හි අභිවෘද්ධිය සහ වෘත්තිකයන්ගේ පුහුණුව උදෙසා වැඩ පිළිවෙළක් ලෙස ආරම්භ කළ කදකදපඉද ඡක්බ්ීජයදක්රි වැඩසටහන මෙනුවර ප්‍රජා සංස්කෘතික වැඩසටහන් සඳහා යම් බලපෑමක් සිදු කරන ලදී. ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාලයන්හි ව්‍යාපෘතියක් සමගම උසස් උපාධි පර්යේෂණ වෙනුවෙන් පැමිණි පිරිසද මෙම දශකයේ රංග කලාවේ ආරම්භක සිළු දැල්වූවෝය. ඒහා සමගාමීව පැමිණි එවකට තරුණියෝ වූ මාලිනී ජයමංගල සහ (..........) කාරියවසම් 1958 දී මෙල්බර්න් හි පැවති ප්‍රජා උත්සවයන් උදෙසා ශ්‍රී ලාංකීය නැටුම් අංශයක් ඉදිරිපත් කරන ලදී. පසුව බ්‍රිස්බෙන්හි ශ්‍රී ලාංකීය ශිෂ්‍යයෙකුගේ ආරාධනයෙන් සහ අනුග්‍රහකත්වය යටතේ එහි ශිෂ්‍ය උත්සවයක් නියෝජනය කිරීම සඳහා ඔවුහු ගෙන්වා ගත් බව කියවේ. එකල සිටි ලාංකිකයන් තම අනන්‍යතාව ඉදිරිපත්කළ තවත් රංග ක්‍රියාවක් වුයේ සම්ප්‍රදායික ඇඳුමින් සැරැසී පැජන්ට් සඳහා ඉදිරිපත් වීමයි. (මේ තොරතුරු ඔවුනගෙන් අසා මට පැවසුනේ 70 දශකයේ අග සිටම මෙනුවර ප්‍රජා කලා කටයුතු වලදී කැපී පෙනෙන දායකත්වයක් දුන් රත්නා ගුරුසිංහය.)


CML news

14th June, 1968.

For distribution to the indoor staffs of Principal Office and Victorian Branch

## CEYLON NIGHT

**On Friday evening, 31st May, members of staff and their friends attended a very enjoyable function in the Martin Room. The evening was arranged by Mr. S. Perera through the courtesy of the Ceylon Tea Centre.**

As many of our readers will recall, Mr. Perera spent some months working with us in 1954 as a Colombo Plan student. He has recently returned to Australia with his wife and family to continue his life assurance training at the A.M.P. Society and has renewed his friendship with former colleagues at the C.M.L.

The function was arranged when Mr. Perera expressed a desire to show us something of his native Ceylon, and the programme included the screening of several films and a display of national costumes, including the traditional saris.

The films shown were "Drums of Lanka" and "Rhythm of the People", both of which depicted aspects of life in Ceylon; "Sushila's Pilgrimage", a tour of holy temples; and "Choicest Ceylon", which described Ceylon's tea industry. Mr. Perera's wife and children and a friend of the family then modelled their national dress as he described and commented on the garments.

The evening concluded with supper featuring pure Ceylon Tea and Indian pastries.

As a result of donations received at the function, an amount of $30 was given to the C.M.L. Auxiliary.

The Perera family and a friend (from left):– Mr. Soma Perera, Sumedha, Hasanthi, Mrs. Chitra Kannangara, Mrs. Sujata Perera and Krishanti.

## C.M.L. AUXILIARY

### SPECIAL APPEAL ROYAL WOMENS HOSPITAL

At the Annual Meeting of the C.M.L. Auxiliary on 9th May, 1968, the generous donations which are made from the staff Charity Fund to the Royal Melbourne and Royal Women's Hospitals through the Auxiliary, were gratefully acknowledged. Some of the newer members of our staff may not know that for very many years the Auxiliary has supported both these hospitals and that the donations made by the Charity Fund, as well as monies raised by the Auxiliary, are directed towards the purchase of specific items of equipment. The current Auxiliary projects, which were undertaken in June 1966, are:–

Royal Melbourne Hospital: Zeiss Microscope valued at $720 – balance owing $206.

Royal Women's Hospital: Hanaulux Operating Theatre Light valued at $1898 – balance owing $1057.

This year, because of the Building Appeal which has been launched for the Royal Women's Hospital, the Auxiliary has decided that monies raised as a result of activities which it plans to organise, will be donated to the special appeal of this hospital.

The Royal Women's has announced the launching of The Book of Life. This is a giant book which is to be permanently displayed at the new hospital and will contain the names of all donors who contribute $1 or more.

The hospital plays a very special part in the lives of so many women in Victoria and, indeed, many families may feel that they owe a debt of gratitude to this hospital and may wish to take this opportunity of expressing their appreciation in a tangible manner.

The C.M.L. Auxiliary would like to write a "chapter of names" in The Book of Life. Although it is not intended to canvass staff personally for donations, it would be appreciated if those who wish to support this appeal would make their donations, either on an individual or family basis, through the Auxiliary. For this purpose donations may be handed in to the Personnel Department where signatures for The Book of Life will be recorded. Donations of $2 or more will be tax deductible and receipts will be issued by the hospital in due course. The Government has undertaken to cover three times, donations made to the appeal.

## ANNIVERSARIES OF SERVICE

Two members of staff have recently celebrated anniversaries of service with the Society and a third will do so during this month. They are Miss T. I. Graham, Personnel Officer (Personnel Department), 30 years on 9th May; Mr. I. L. Palmer, Collector Assurance Accounts Officer (Victorian Branch), 30 years on 30th May; Miss E. B. Symons, Senior Assistant – Salaries (Chief Accountant's Department), 20 years on 21st June.

50 දශකයේදී අධ්‍යනය සඳහා මෙරටට පැමිණි සිටියෝ අතරින් දයාල් අබේසේකර,

16 වන පිටට